# කළමනාකරණ කමිටු රැස්වීම.

දිනය - 2016.11.07

වේලාව - ප.ව. 02.00

ස්ථානය - ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප.)

මූලාසනය - එම්.ඒ.බී. දයා සෙනරත් මයා (ප්‍රධාන ලේකම් - බ.ප.)

සහභාගී වූ නිලධාරීන්,

- **කේ.කේ. චම්පිකා කනේරු මිය.**
  **නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පාලන)**
- **සිරිසෝම ලොකුවිතාන මයා.**
  **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)**
- **එන්.බන්දුල ප්‍රේමකුමාර මයා.**
  **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය)**
- **ඩී.එම්.එන්. දිසානායක මිය.**
  **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්)**
- **ඩබ්.එම්.ඩී.එන්. රණසිංහ මයා.**
  **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)**
- **ජී.ඒ.එන්. ජයන්ත මයා**
  **ආදායම් කොමසාරිස් (බ.ප)**
- **චම්පිකා පතිරණ මිය.**
  **අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)**
- **නිශාන්ති විජේසුන්දර.**
  **අධ්‍යක්ෂ (අධ්‍යක්ෂ-ගිණුම් හා ගෙවීම්)**
- **සුනේත්‍රා පතිරත්න මිය.**
  **අධ්‍යක්ෂ (අයවැය)**
- **මහේෂ් විජේසේකර මයා.**
  **අධ්‍යක්ෂ (ගොඩනැගිලි)**
- **එල්.ඒ.බී.එල්.ගුණසේන මිය.**
  **ප්‍රධාන ගණකාධිකාරී (ඉංජිනේරු)**
- **කේ.එන්.සූරියආරච්චි මිය.**
  **සහකාර ප්‍රධාන ලේකම් (පාලන)**
- **ආර්.ඒ.ටී.ආර්.රාමනායක මිය.**
  **අධ්‍යක්ෂ (සැලසුම්)**

# <u>සාකච්ඡා කරන ලද කරුණු</u>

## <u>පාලන අංශය</u>

| අනු අංක | කාරණය | තීරණය | වගකීම |
|---|---|---|---|
| 01. | 2016 සඳහා ඵලදායිතා වැඩසටහන - අංශ වලින් තොරතුරු ලබා ගැනීම | සියලුම අංශ සඳහා පත් කරන ලද ඵලදායිතා කව නායකයින්ගේ විස්තර නොවැම්බර් 15 වන විට ලබා ගැනීම හා මෙම මාසය ඇතුළත එම නායකයින් පුහුණු කිරීම සඳහා වැඩසටහනක් සංවිධාන කිරීම.<br>2018 වසරේ සිට ප්‍රධාන ලේකම් කාර්යාලය මඟින් අන්තඃපළාත් ඵලදායිතා තරඟ සංවිධානය කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන).<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු). |
| 02. | ශ්‍රාවස්ති පරිශ්‍රය තුල වාහන ගාල් කිරීම සහ නැවැත්වීම | ශ්‍රාවස්ති පරිශ්‍ර උද්‍යානයේ පොකුණ ඉදිරිපස කොටස වාහන ගාල් කිරීම සඳහා යෝජනා විය. ගිණුම් කාරක සභාව පැවැත්වෙන බ්‍රහස්පතින්දා දිනයන් හී දී මන්ත්‍රීවරුන් හට වාහන නැවැත්වීම සඳහා මංතීරු වෙන් කිරීමේ ක්‍රියාවලිය ඉදිරියටත් කිරීම සඳහා උපදෙස් ලබා දෙන ලදි. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 03. | තොරතුරු දැන ගැනීමේ පනත ක්‍රියාත්මක කිරීම | නිලධාරීන් නම් කර එවීමේ දී අඩුපාඩු සහිත ව යොමු කරන ලද කාර්යාල (සැලසුම්, ඉංජිනේරු හා අභ්‍යන්තර විගණන) හැකි ඉක්මනින් එම විස්තර සහිත ව සම්පූර්ණ කර එවීමට කටයුතු කිරීම.<br>තොරතුරු දැන ගැනීමේ පනත ක්‍රියාත්මක කිරීමේ දී තොරතුරු තාක්ෂණ අංශයේ අවශ්‍ය උපදෙස් ඉල්ලා ICTA ආයතනය මඟින් ලිඛිත ව විමසීමක් කිරීම.<br>තොරතුරු දන ගැනීමේ පනත ක්‍රියාත්මක කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව තොරතුරු දන ගැනීමේ කොමිෂන් සභාව මඟින් ලිඛිතව විමසීමක් කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)<br><br>අධ්‍යක්ෂ(අභ්‍යන්තර විගණන)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 04. | මාණ්ඩලික නිලධාරීන් සඳහා පුවත්පත් මිලට ගැනීම | ප්‍රධාන ලේකම් කාර්යාලයේ පුවත්පත් පෞද්ගලික නමට මිල දී ගන්නා මාණ්ඩලික නිලධාරීන්ගෙන් පුවත්පත් මිලට ගැනීම වෙනුවෙන් පුවත්පත් වටිනාකමින් 15%ක් අය කිරීම සහ එක් අංශයක් වෙනුවෙන් මිලට ගන්නා පුවත්පත් සඳහා එම පුවත්පත රැගෙන යනු ලබන නිලධාරීන්ගෙන්, පුවත්පත් වටිනාකමින් 10%ක් ද වන පරිදි අය කර ගැනීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |

**<u>පිරිස් හා පුහුණු අංශය</u>**

| අනු අංක | කාරණය | තීරණය | වගකීම |
|---|---|---|---|
| 01. | තොරතුරු තාක්ෂණ සේවයේ සහකාර අධ්‍යක්ෂ තනතුර. | ප්‍රධාන ලේකම් කාර්යාලයේ තොරතුරු තාක්ෂණ අංශය වෙනුවෙන් නව "සහකාර අධ්‍යක්ෂ" තනතුර සඳහා සුදුසුකම් ලත්, දක්ෂ පුද්ගලයෙක් බඳවා ගැනීම සඳහා කටයුතු කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 02. | පළාත් සභා නිලධාරීන්ගේ විනය කටයුතු නියාමනය කිරීම. | පළාත් සභා නිලධාරීන් වෙනුවෙන් විනය කටයුතු සම්බන්ධ පුහුණු වැඩසටහන සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලියාපදිංචි ව ඇති පරීක්ෂණ නිලධාරි, පැමිණිල්ල මෙහෙයවන නිලධාරි හා රැකවරණ නිලධාරි යන නිලධාරීන්ගෙන් සුදුසු සම්පත් දායකයින් යොදා ගැනීම සඳහා විමසීමක් කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 03. | ප්‍රධාන ලේකම් කාර්යාලයේ පිළිගැනීමේ නිලධාරි තනතුර. | පිළිගැනීමේ නිලධාරි තනතුර සඳහා ත්‍රෛ භාෂා හැකියාව ඇති නිලධාරීන් අවශ්‍ය බැවින්, වහාම තනතුරක් ඇති කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |

**<u>සැලසුම් අංශය</u>**

| අනු අංක | කාරණය | තීරණය | වගකීම |
|---|---|---|---|
| 01. | ත්‍රිකුණාමලයේ දී පවත්වන ලද අයවැය ප්‍රගති සමාලෝචන රැස්වීම | අයවැය ප්‍රගති සමාලෝචන රැස්වීමේ දී විවිධ අමාත්‍යාංශ වලට අදාලව ගන්නා ලද තීරණ සහ පවරන ලද වගකීම් සම්බන්ධයෙන් වාර්තාව සකස් කර එවන මෙන් සියලුම ලේකම්වරුන් වෙත ලිපියක් යැවීමට කටයුතු කිරීම හා වාර්තා රැස් කර ක්‍රියාත්මක වීම හා පසු විපරම් කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| 02. | සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් අධීක්ෂණ ක්‍රමවේදයක් සැකසීම | මූල්‍ය හා භෞතික ප්‍රගතිය විමසීම සඳහා අන්තර්ජාලය හරහා අධීක්ෂණ ක්‍රමවේදයක් සැකසීම සහ එය සෑම බදාදා දිනක ම යාවත්කාලීන කිරීමට කටයුතු කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |

**ඉංජිනේරු අංශය**

| අනු අංක | කාරණය | තීරණය | වගකීම |
|---|---|---|---|
| 01. | පළාත් සභාවේ ලේඛන සංරක්ෂණය සහ ක්‍රමවත් කිරීම. | බස්නාහිර පළාත් සභාවේ වෙබ් අඩවියට අනවසරයෙන් ඇතුළු වීම් කීප වරක් වාර්තා වී ඇති බැවින්, එහි ආරක්ෂාව තහවුරු කිරීම සඳහා කඩිනමින් පියවර ගැනීම.<br>පළාත් සභාවේ සියලුම කාර්යාල වල ලේඛන සංරක්ෂණය කිරීමේ වැඩසටහනක් සැකසීම සඳහා ICTA ආයතනය හරහා ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 02. | තොරතුරු තාක්ෂණය බහිස්සේවාර්ථනය කිරීම. | තොරතුරු දැන ගැනීමේ පනත ක්‍රියාත්මක කිරීම නිසා ඉදිරියේ දී හැකි තාක් තොරතුරු පළාත් වෙබ් අඩවිය හරහා ලබා දීම සඳහා නිල වෙබ් අඩවිය වහාම නවීකරණය කිරීම හා යාවත්කාලීන කිරීම කළ යුතු බව ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදි.<br>නමුත්, එහි මන්දගාමී බව හා හසුරුවා ගැනීමේ දෝෂ සහිත බව නිසා තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන ආයතනයේ දායකත්වය ප්‍රමාණවත් නොවන බැවින්, දිගු කාලීන පිළියමක් ලෙස බහිස්සේවාර්ථනය (Outsourcing) කිරීම සඳහා ඉදිරි කටයුතු සිදු කිරීම, කළමනාකරණ කමිටු යෝජනාවක් ලෙස ලේකම්වරුන්ගේ රැස්වීමට යොමු කිරීම හා එහි දී පත් කරන ලද කමිටු තීරණය අනුව කටයුතු කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 03. | ඉංජිනේරු නිලධාරීන්ගේ වර්ගීකරණ ගැටලුව. | පළාත් සභා හා පළාත් පාලන ආයතනයන් හි සේවය කරනු ලබන ඉංජිනේරු නිලධාරීන් ස්ථාන මාරු කිරීමේ ක්‍රමවේදය සහ වර්ගීකරණය කිරීමේ දී වන අවාසිය පිළිබඳ ව නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) විසින් දන්වන ලද අතර, එය ඉංජිනේරු සේවා මණ්ඩලයට යොමු කිරීම සඳහා සැකසූ වාර්තාවක් ඉදිරිපත් කිරීමට යෝජනා විය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 04. | රැස්වීම් ශාලා සඳහා මාර්ග පුවරු ප්‍රදර්ශනය කිරීම | මහජන දිනය සහ විවිධ රැස්වීම් වෙනුවෙන් රැස්වීම් ශාලා වෙත පැමිණෙන පිරිස් සඳහා මං පුවරු ප්‍රදර්ශනය කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 05. | ශ්‍රාවස්ති ගොඩනැගිල්ලෙහි කොන්ක්‍රීට් සිවිලිමෙහි කොටස් කඩා වැටීම | ශ්‍රාවස්ති ගොඩනැගිල්ලෙහි කොන්ක්‍රීට් සිවිලිමෙහි කොටස් කැඩී යාම වැළැක්වීම හදිසි හා අත්‍යාවශ්‍ය කටයුත්තක් බැවින්, ගැටලුවට විශාල වශයෙන් මුහුණ දෙන ආයතන මඟින් තොරතුරු ලබා ගෙන නැවත කපරාරු කිරීම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |

| | | | |
|---|---|---|---|
| 06. | ඉංජිනේරු අංශය සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් බඳවා ගැනීම. | රාජ්‍ය අංශයේ සේවය කර, දැනට විශ්‍රාමිකව සිටින නමුත්, සේවය කළ හැකි නිලධාරීන් ඉංජිනේරු, වාස්තු විද්‍යාඥ සහ තාක්ෂණ නිලධාරි යන තනතුරු සඳහා බඳවා ගැනීමට කටයුතු කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 07. | රාජකාරි කටයුතු සඳහා අන්තර්ජාලය භාවිතයේ දී ඇති වන දෝෂය | ප.ව.12.00-1.00ත් අතර කාලයේ දී රාජකාරි කටයුතු සඳහා අන්තර්ජාලය වෙත ප්‍රවිෂ්ට වීමට නොහැකි වීම සඳහා හේතු හඳුනා ගැනීම වෙනුවෙන්, පසුගිය මාසය තුල අන්තර්ජාලය භාවිතා කරන ලද ආකාරය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |

## <u>ආදායම් දෙපාර්තමේන්තුව</u>

| අනු අංකය | කාරණය | තීරණය | වගකීම |
|---|---|---|---|
| 01. | ආදායම් ප්‍රවර්ධන කමිටු පිහිටුවීම. | බස්නාහිර පළාතේ ආදායම් ප්‍රවර්ධනය සඳහා ඉදිරියේ දී ආදායම් ප්‍රවර්ධන කමිටුවක් පත් කර, ආදායම් වැඩි කර ගැනීමට කටයුතු කිරීම. | ආදායම් කොමසාරිස් (බ.ප)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) |